වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීම, ආයතනයේ ධාරිතාව වැඩිකිරීම, ඉගෙනුම් පරිසරය හා පශ්චාත් උපාධි පැවැත්වීම අරමුණු කර ගනිමින් උපකරණ සඳහා රු. මිලියන 150 ක් ද ඇතුළත්ව රු. මිලියන 359.9 ක පිරිවැයකට ඉදිකිරීමට යෝජිතව තිබූ ඉගෙනුම් සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය (Learning Resources Development Centre) සඳහා මූලික වශයෙන් 2011 වර්ෂයේදී රු. මිලියන 17.9 ක් හා ඉතිරි මුදල් 2012 වර්ෂයේ සිට වර්ෂ 03 ක් දක්වා වාර්ෂිකව ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් ලබාදීමටත් අනුමැතිය ලැබී තිබුණි. එම ප්‍රතිපාදන ඇතුලත මුදල් කළමනාකරණය කර ගනිමින් ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සිදුකල යුතු බවට අංක. අමප/11/2152/539/017-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දන්වා තිබුණි. 2016 වර්ෂය අවසානය වනවිට ඉදිකිරීම් වෙනුවෙන් රු. මිලියන 206.5 ක් වැයකර තිබුණද අනුමත ප්‍රතිපාදනය ඉක්ම වූ රු. මිලියන 75 ක මැදිරි සංකීර්ණයේ අතිරේක වැඩ සඳහා වූ වියදම සඳහා කැබිනට් අනුමැතිය නොලැබීම හේතුවෙන් 2016 වර්ෂය තුල ඉදිකිරීම් කටයුතු කළ

නොහැකි වී තිබුණි. කෙසේ වුවද නිසි සැලසුමකින් හා කාර්යක්ෂමතාවයකින් යුක්තව කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වී තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ජූලි 27 දිනැති අංක. DMS/E4/47/2/280/1 දරන ලිපියට පටහැනිව 2012 ඔක්තෝබර් 12 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහණය කිරීමේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව තනතුරට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබිය දී දරන්නාට පෞද්ගලික වන සේ තනතුරු වල පිහිටුවා තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා නොතිබුණි. එසේම ඉන් කථිකාචාර්යවරුන් 05 දෙනෙකුගේ පවත්නා සුදුසුකම් අදාල විශ්වවිද්‍යාල වලින් සනාථ කර ගෙන නොතිබුණි.

(ආ) දරන්නාට පුද්ගලික වනසේ ජ්‍යෙෂ්ඨ ගුරු සහකාර තනතුරේ පිහිටුවා තිබුණු කථිකාචාර්යවරයෙකු කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විදේශ ශිෂ්‍යත්වයක් ලැබ පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා තායිලන්තයට ගොස් තිබුණද, නියමිත කාලය තුළ උපාධිය සම්පූර්ණ කර නොතිබුණු අතර එම ශිෂ්‍යත්වය වෙනුවෙන් වැයකල රු. 3,876,544 ක් හා අතිරේක අධ්‍යයන වියදම් ලෙස බාක් 154,503.43 ක් (රු. 34,170) අයකරවා ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොතිබියදී හා පවත්නා සුදුසුකම් අදාළ විශ්වවිද්‍යාල මඟින් තහවුරු කර ගැනීමකින් තොරව ගුරු සහකාර නිලධාරියෙකු 2013 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තොරතුරු තාක්ෂණ අංශයෙහි කථිකාචාර්ය (ආධුනික) තනතුරට පත්කර තිබුණි.

(ඈ) ඉන්දියාවෙහි විශ්වවිද්‍යාලයක වර්ෂ දෙකක පශ්චාත් උපාධිය සම්පූර්ණ කර තිබුණු කථිකාචාර්යවරයෙකුගේ උපාධියේ හා ප්‍රතිඵලවල වලංගුභාවය එම විශ්වවිද්‍යාලයෙන් තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ අනුමත බඳවාගැනීමේ පටිපාටියෙහි 5.4 (i) ඡේදයට අනුව අධ්‍යයන කාණ්ඩයට අයත් තනතුරුවලට බඳවා ගැනීමේ දී හා උසස් කිරීමේ දී එම පරිපාටියට

අනුකූල විය යුතු බව දක්වා තිබියදී ඊට පටහැනිව ගොඩනැගිලි සේවා තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී පාඨමාලාව සඳහා පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු කථිකාචාර්යවරියක 2016 ජූනි 01 දින සිට කථිකාචාර්ය (ආධුනික) තනතුරට බඳවාගෙන තිබුණි.

(ඊ) සහකාර මූල්‍යාධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ 5.4.1 ඡේදය අනුව, පවත්නා පුරප්පාඩු වලින් සියයට 60 ක් බාහිර අයදුම්කරුවන් වෙතින් බඳවා ගැනීම සිදුකල යුතු වුවද, ඊට පටහැනිව අනුමත කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු තනතුරු 3 සඳහා අභ්‍යන්තර නිලධාරීන් බඳවාගෙන තිබුණි.

(උ) අධ්‍යක්ෂ පත්කිරීම (ඇතුලත් කිරීම, ප්‍රතිනතය කිරීම සහ තත්ත්ව සහතික කිරීම)

(i) 2008 අංක 31 දරන වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතෙහි 16(1) වගන්තියට අනුව විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ (ඇතුලත් කිරීම, ප්‍රතිනතය කිරීම සහ තත්ත්ව සහතික කිරීම) තනතුරට පත්කිරීමේ දී තේරීම් කමිටුවක නිර්දේශය මත පූර්ණ කාලීන නිලධරයෙකු වශයෙන් පාලක මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතුය. එහෙත්, ඊට පටහැනිව 2014 අගෝස්තු 28 දිනැති අංක UNIVOTEC/AC/SAL/112 දරන ලිපිය මගින් 2014 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 03 ක කාලපරිච්ඡේදයක් සඳහා තනතුර දරන්නාට පුද්ගලික වන සේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II තනතුරක කථිකාචාර්යවරයෙකුට දැනට දරන තනතුරට අතිරේක වශයෙන් විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ තනතුරෙහි පත්වීම් ලබාදී තිබුණි. එසේම තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය 2016 වර්ෂය අවසානය වනවිටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයෙහි 13.1 (අ) වගන්තියට අනුව නිලධාරියෙකුට අතිරේක තනතුරක පූර්ණ රාජකාරී ඉටුකිරීමට හෝ එක් තනතුරකට වැඩි තනතුරු ගණනක රාජකාරී ඉටුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද ඊට පටහැනිව විශ්වවිද්‍යාලය පූර්ණ කාලීනව ක්‍රියා කල යුතු කථිකාචාර්ය හා අධ්‍යක්ෂ යන තනතුරු 2 ක කාර්යයන් එක් නිලධාරියෙකු වෙත පවරා තිබුණි. ඒ අනුව කථිකාචාර්ය තනතුරෙහි වැටුප් හා දීමනා වලට අමතරව අධ්‍යක්ෂ තනතුරෙහි පත්වීම් ලද 2014 සැප්තැම්බර් සිට එම තනතුරට අදාල වරප්‍රසාදයක් වන වාහන සහ ඉන්ධන දීමනා ගෙවා තිබුණු

අතර විගණිත දිනය වන 2017 අප්‍රේල් දක්වා එසේ ගෙවූ මුදල රු. 942,180 ක් විය.

(ඌ) රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය සඳහා වැඩබලන අධ්‍යක්ෂවරයෙකු පත්කිරීම

(i) ආයතන සංග්‍රහයෙහි II පරිච්ඡේදයෙහි 13.1.2 හා 13.4 වගන්තීන්ට අනුව වැඩ බැලීමේ පත්වීමක් සඳහා පත් කරනු ලබන නිලධාරියෙකුට අනුමක බදවා ගැනීමේ පටිපාටියට අනුව පත්කිරීම සඳහා සෑම අතින්ම සුදුසුකම් තිබිය යුතුය. කෙසේ වුවද අධ්‍යක්ෂ තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණු විශ්වවිද්‍යාලයේ දරන්නාට පුද්ගලික වනසේ කථිකාචාර්ය II තනතුරෙහි පිහිටුවා තිබූ කථිකාචාර්යවරයෙකු 2016 ජූලි 15 දින සිට ක්‍රියාක්මක වන පරිදි විද්‍යායතනයේ වැඩබලන අධ්‍යක්ෂ තනතුරට පත්කර තිබුණු අතර වැඩ බැලීමේ වැටුප් සහ ඉන්ධන දීමනා වශයෙන් විද්‍යායතනය විසින් ගෙවා තිබූ මුදල රු. 179,100 ක් විය.

(ii) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.3.1 (vi) ඡේදයට අනුව වැඩ බැලීමේ පත්වීමක් නිශ්චිත නොවූ කාලපරිච්ඡේදයක් සඳහා පත් නොකල යුතු බව දක්වා තිබිය දී. 2016 ජූලි 14 දිනැති අංක UVT/Admin/SAL/111 දරන පත්වීමේ ලිපියට අනුව ඉදිරි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා පත්වීම් ලබා දී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබූ අතර අභ්‍යන්තර විගණක හා ලිපිකරු ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2011 දෙසැම්බර් 23 දිනැති අංක DMA/ADM/2011/1-26 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට හා මුදල් රෙගුලාසි 133 (2) (අ) (i) කෙරෙහි අවධානය යොමු කර විශ්වවිද්‍යාලයේ හා විද්‍යායතනවල් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම, කාර්ය සාධනය, ගිණුම්කරණ, මූල්‍ය හා මෙහෙයුම් අංශයන්හි අභ්‍යන්තර පාලන ඇගයීම් වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සැලසුම් කර නොතිබුණි.

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණන සැලැස්මට අනුව ආවරණය කිරීමට අපේක්ෂිතව තිබූ ක්ෂේත්‍ර 14 ක් අතුරින් විගණිත ක්ෂේත්‍ර 02කට අදාළව වර්ෂය තුළ විගණන වාර්තා 11ක් නිකුත් කර තිබුණ ද ඉන් වාර්තා 05ක් පුද්ගල වැටුප් තීරණය කිරීමට අදාලව නිකුත් කර තිබුණි.

(ආ) වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය යටතේ ආරම්භ කල විශ්වවිද්‍යාල විද්‍යායතන 06හි අභ්‍යන්තර විගණන කාර්යයන්හි වගකීම් මෙම අංශය වෙත පැවරී තිබුණද, විද්‍යායතන සම්බන්ධයෙන් අඛණ්ඩ විගණනයක් සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය පමණක් විගණනය කර වාර්තාවක් නිකුත් කර තිබුණි.

5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව විගණන වාර්තාව සමඟ වාර්ෂික අවසාන ගිණුම් ඇතුලත් වාර්ෂික වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් විශ්වවිද්‍යාලයේ 2015 ගිණුම් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	මූල්‍ය පාලනය	නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා නොකිරීම.
(ආ)	ගබඩා පාලනය	නිලධාරීන් වෙත භාණ්ඩ නිකුත් කිරීමේ දී නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම.

(ඇ)	කාර්ය මණ්ඩල පරිපාලනය	නිලධාරීන්ගේ සුදුසුකම් අදාල ආයතනවලින්/විශ්වවිද්‍යාලවලින් සනාථ කරවාගෙන නොතිබීම, බඳවාගැනීමේ පරිපාටිය අනුව කටයුතු නොකිරීම.
(ඈ)	පාඨමාලා පැවැත්වීම	ප්‍රශස්ථ ධාරිතාවයෙන් පාඨමාලා නොපැවැත්වීම හා දේශකවරුන්ගේ කාර්යසාධන ඇගයීම් නොකිරීම.
(ඉ)	අභ්‍යන්තර පාලනය	නිලධාරීන් අතර නිසි වැඩ බෙදීමක් නොමැති වීම, බැහැර යාමේ ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } විවිවයි/බී/යුවිටි/එෆ්ජී/2016/02

මගේ අංකය / மது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ජනවාරි 29 දින

උපකුලපති

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත්- 1 ලේකම් - නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

2 ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විමසුම් අංක වීවීවයි/බී/යූවීවී/එෆ්ඒ/ 2016/02 (2018.01.28 දිනැති) සඳහා පිළිතුරු.

අංකය	විගණන විමසුම		පිළිතුරු
2.2	**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**		
2.2.1	**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**		
(අ)	2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත 18 වන වගන්තිය	පාලක සභා රැස්වීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙකු හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා සාමාජිකත්වය දැරිය යුතු වුවද සමාලෝචිත වෂර්ය තුළදී පවත්වන ලද රැස්වීම් 11කින්, මුදල් අමාත්‍යාංශයෙන් නම් කළ නිලධාරියා රැස්වීම් 09 ක් සඳහා ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා රැස්වීම් 08 ක් සඳහා ද සහභාගී වී නොතිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ වල ඵලදායකත්වය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.	මෙම නිලධාරීන් පාලක මණ්ඩලය වෙත පත් වනුයේ නිල බලයෙනි. සෑම වෂර්යකම මුලදී පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වෙන දිනයන් සාමාජික මහත්ම මහත්මීන් වෙත දැනුම් දී ඇති අතර, මාසිකව පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වෙන අවස්ථාවන්හිදී වෙන් වෙන්ව නැවත දැනුම් දීම සිදු කර ඇත. මෙම නිලධාරීන් නිල බලයෙන් පත් වූවන් නිසා වාර තුනක් සහභාගි නොවූ පමණින් ඉවත් කිරීමද කල නොහැක. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත අනුව, අවම සාමාජික සංඛ්‍යාව සහභාගි වූයේ නම්, ඉහත නිලධාරීන් නොමැතිව පාලක මණ්ඩල රැස්වීම් පැවැත්විය නොහැකි බව සඳහන්ව නොමැත. ඒ අනුව රැස්වීම් පවත්වා ඇත.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571	2010 දෙසැම්බර් 31 දිනට පැවති හිමිකම් නොපෑ එකතුව රු.1,266,275 ක් වූ පුස්තකාල, විද්‍යාගාර හා නේවාසිකාගාර තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ දක්වා විශ්වවිද්‍යාලය එහි සිසුන් හට ඔවුන්ගේ තැන්පතු නැවත ඉල්ලුම් කිරීමට නිශ්චිත කාල සීමාවක් දන්වා නොමැත. කෙසේ වුවද මෙම රු.1,266,275, ක් වූ තැන්පතු 2017 වෂර්යේ දී ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ)	2013 ඔක්තෝම්බර් 24 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමත්‍යාංශයේ 2013/2014 (ii) චක්‍රලේඛය	විදේශ පුහුණු වැඩසටහනක් සම්පූණර් කල සියළුම නිලධාරීන් සහභාගී වූ වැඩසටහන පිළිබඳ වාතර්ාවක් මාසයක් ඇතුළත ආයතන ප්‍රධානියාට ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද 2013 වෂර්යේ සිට විදේශ ගත වූ නිලධාරීන් 21 දෙනෙකුගෙන් 18 දෙනෙකු එවැනි වාතර්ා ලබා දී නොතිබුණි.	2013 වෂර්යේ සිට විදේශගත වී, අදාල වැඩසටහන පිළිබඳ වාතර්ාවක් ආයතනයේ ප්‍රධානියා වෙත ලබා නොදුන් නිලධාරීන් වෙත අදාළ වාතර්ා ලබා දෙන ලෙස දැනුම් දී ඇත. විදේශගත වී, අදාල වැඩසටහන පිළිබඳ වාතර්ා ආයතන ප්‍රධානියා වෙත ලබා නොදුන් නිලධාරීන් වෙත නැවත විදේශ පුහුණු අවස්ථාවන් ලබා නොදීම වතර්මානයේ සිදු කෙරේ.
3	<u>මූල්‍ය සමාලෝචනය</u>		
3.1	<u>මූල්‍ය ප්‍රතිඵල</u> ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව, විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂර්ය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.214,709 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වෂර්යේ ඌනතාවය රු.3,054,300 ක් වූයෙන් ඉකුත් වෂර්යට සාපේක්ෂව සමාලෝචිත වෂර්යේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,269,009 ක වධර්නයක් ඇති වී තිබුණි. සේවක පිරිවැය රු.16,552,372 කින් වැඩිවී නිපුණතා ආංශික සංවධර්න වැඩසටහනේ ප්‍රදාන රු.7,147,326 කින් අඩුවුවද වෂර්යේ පුනරාවතර්න ප්‍රදාන රු.27,787,500 කින් වැඩිවීම ඉහත වධර්නයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. සමාලෝචිත වෂර්ය සහ ඉකුත් වෂර් 04ක මූල්‍ය ප්‍රතඵල විග්‍රහ කිරීමේදී 2012 වෂර්යේ ඌනතාවය 2013 වෂර්යේදී සැලකිය යුතු අතිරික්තයක් බවට පත්වී 2014 වෂර්ය වන විට අතිරික්තය අඩු වී තිබුනු අතර 2015 වෂර්යේ ඌනතාවයක් හා සමාලෝජවිත වෂර්යේ නැවත අතිරික්තයක් බවට පත වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන	

	වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වෂර්යේ රු.139,569,752 ක් වූ දායකත්වය සමාලෝචිත වෂර්යේදී රු.216,650,852 ක් වී තිබුණි.	
4	**ඉමහැයුම් සමාලෝචනය**	
4.1	**කායර් සාධනය**	
(අ)	තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා සුදුසුකම් ලබාගත් අය වෙත උසස් අධ්‍යාපන අවස්ථාවන් ලබා දීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණයි. එසේම තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා විෂයමාලා සංවධර්නය කිරීම සඳහා දායක වීම, විශ්වවිද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා පිළිගත හැකි සුදුසුකම් ලැබූ මධ්‍යම මට්ටමේ කාමර්ික නිලධාරීන් සඳහා අධ්‍යන පාඨමාලා සැපයීම, ජාතික වෘත්තීය සුදුසුකම්ලත් අයට ඔවුන්ගේ නිපුණතා උසස් කිරීම සඳහා අවශ්‍ය පාඨමාලා ඉදිරිපත් කිරීම හා අඛණ්ඩ වෘත්තීමය සංවධර්නය සඳහා ව්‍යාප්ති පාඨමාලා ඉදිරිපත් කිරීම ද අරමුණු වේ. එකී අරමුණු ඉටුකර ගැනීමට අදාලව පාඨමාලා සඳහා තත්ත්ව සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.	
(i)	2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතෙහි 21(i) වගන්තියට අනුව ඇතුලත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව පිහිටුවා තිබූ අතර එම සභාවේ 2010 මැයි 18 දිනැති තීරණය ප්‍රකාරව විශ්වවිද්‍යාලය පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආතනයෙන් හා අනෙකුත් පාඨමාලා සඳහා මොරටුව, පේරාදෙණිය හා කොළඹ විශ්වවිද්‍යාල මගින් ප්‍රතීතනයන් ලබා ගැනීමටත් ඊට අමතරව විදේශීය පිලිගත් විශ්වවිද්‍යාල වලින් ප්‍රතීතනයන් ලබා ගැනීමටත් තීරණය කර තිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලය පිහිටුවා වෂර් 07 ක කාලයක් ගත වී තිබුණද අපේක්ෂිත පරිදි උපාධි පාඨමාලාවල ප්‍රතීතනයන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, අදාල ඉංජිනේරු උපාධි පාඨමාලා ප්‍රතීතනය කරන අතර අනෙකුත් විශ්වවිද්‍යාලයන් හට තවත් විශ්වවිද්‍යාලයක පාඨමාලා ප්‍රතීතනය කිරීමේ ක්‍රමවේදයක් නොමැත. Building Services Technology, Mechatronics Technology, Manufacturing Technology යන කේෂ්ත්‍ර සඳහා මෙම විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යන උපාධි පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි ප්‍රතීතනය 2017.10.10 දින ලබා ගෙන ඇත.
(ii)	නිපුණතා ආංශික සංවධර්න වැඩසටහන (SSDP) යටතේ විශ්ව විද්‍යාලය පවත්වාගෙන යන පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හා දේශීය, විදේශීය වෘත්තිමය ආයතනවලින් ප්‍රතීතනය ලබා ගැනීමට 2015 හා 2016	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය ලබා ගෙන ඇත. මෙමගින් අප විශ්වවිද්‍යාලයෙන් පිරිනමන උපාධි, අනෙකුත් පොදු රාජ්‍ය මණ්ඩලීය

	වෂර් සඳහා පිළිවෙලින් රු. 50,000 ක් හා රු. 500,000 ක් වශයෙන් ප්‍රතිපාදන ලබා දී තිබුණද විගණිත දිනය වූ 2017 මාතර්ු 02 දින වන විටත් ප්‍රතීතනයන් ලබා ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.	විශ්වවිද්‍යාල සේවාවේ සාමාජිකත්වය දරණ විශ්වවිද්‍යාල මගින් පිළිගැනීමට භාජනය වේ. 2016 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි ප්‍රතීතනය සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කරන ලද අතර, අදාල ඇගයීම් කිරීමෙන් අනතුරුව, Building Services Technology, Mechatronics Technology, Manufacturing Technology යන කේෂ්ත්‍ර සඳහා මෙම විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යන උපාධි පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි ප්‍රතීතනය 2017.09.08 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ලබා දෙන ලදි.
(iii)	2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතෙහි 21 (ආ) (ii) වගන්තියට අනුව විශ්වවිද්‍යාලයට ඇතුලත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාවට ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය හෝ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය නියෝජනය කිරීම සඳහා පත් කරන ලද පත් කළ සාමාජිකයන් අතුරින් අවම වශයෙන් එක් අයෙකු හෝ ඇතුළත් වන පරිදි පාලක මණ්ඩලය විසින් නම් කරනු ලබන පාලක මණ්ඩලයේ නියෝජිතයන් දෙදෙනෙක් ඇතුළත් විය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වෂර්යේ පවත්වන ලද තත්ත්ව සහතික සභා රැස්වීමට මණ්ඩලයෙන් එක් නියෝජිතයෙක් පමණක් ඇතුළත් වී තිබුණි.	ඇතුලත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව පැවැත්වීම සඳහා ආරම්භයේදී එක් සමාජික මහත්මයෙකු පමණක් පත්කර රැස්වීම් පවත්වන ලදී. වතර්මානයේ, ඇතුලත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව සඳහා, පනතේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සාමාජික මහතුන් දෙදෙනෙකු පත් කර ඇත.
(ආ)	<u>උපාධි පාඨමාලා පැවැත්වීම</u>	
(i)	උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම ආරම්භ කළ 2010 වෂර්යේදී හා 2012 වෂර්යේදී පූණර් කාලීන පාඨමාලා පිළිවෙලින් 07 ක් හා 08 ක් සඳහා සිසුන් බඳවාගෙන තිබුණද , සමාලෝජිත වෂර්ය වන විට ඉන් පාඨමාලා 05ක් වෙනුවෙන් පමණක් සිසුන් බඳවා ගෙන තිබුණු අතර අනෙකුත් පාඨමාලා සඳහා සිසුන් බඳවා ගෙන නොතිබුණි.	මෙම විශ්වවිද්‍යාලයේ පූණර්කාලීන හා අධර්කාලීන පාඨමාලා නොව, රැකියාවල නියුතු නොවන අයට සතියේ දිනවල හා රැකියාවල නියුතු අයට සතිඅන්ත ලෙස උපාධි පාඨමාලා පැවැත්වේ. එබැවින් මේ සියලුම පාඨමාලා පූණර්කාලීන ලෙස සැලකිය යුතුය. මේ නිසා අවශ්‍ය ශිෂ්‍ය උපදේශන පැය ගණන එකම මට්ටමේ පවත්වා ගැනීමට සතියේ දින පාඨමාලා වල සෙමෙස්තරය සති 15 ක් වන අතර සතිඅන්ත සෙමෙස්තරය සති 23 ක් ලෙස පැවැත්වේ.

		ශ්‍රමික වෙළඳපොල ඉල්ලුම් හා විශ්වවිද්‍යාලය සතු හැකියාවන් පදනම් කර ගෙන ක්‍රියාකාරී සැලසුම ප්‍රකාරව 2013, 2014 හා 2015 යන වෂර්වල නව පාඨමාලා හඳුන්වා දී ඇති අතර එම පාඨමාලා සඳහා සිසුන් බඳවා ගෙන ඇත.
(ii)	2013 වෂර්යේ සිට පූණර් කාලීන පාඨමාලා වලට අමතරව සති අන්ත පාඨමාලා (අධර්කාලීන) වෙනුවෙන් ද සිසුන් බඳවා ගෙන තිබුණු අතර සමාලෝචිත වෂර්ය වන විට පූණර් කාලීන පාඨමාලා 05ක් වෙනුවෙන් සිසුන් 122 දෙනෙකු ද සති අන්ත පාඨමාලා 13 ක් වෙනුවෙන් සිසුන් 462 දෙනෙකු බඳවාගෙන තිබූ අතර පූණර් කාලීන පාඨමාලා සඳහා නව පාඨමාලා හඳුන්වා දී සම්පත් උපරිම අයුරින් භාවිතා කළ හැකි වන පරිදි සිසුන් බඳවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.	විශ්වවිද්‍යාලය පිහිටුවීමේ අරමුණ අනුව 2016 වෂර්ය දක්වා උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගනු ලැබුයේ NVQ – 5 මට්ටම හෝ එම මට්ටමට සමාන ඩිප්ලෝමාධාරීන් වේ. ඔවුන් වැඩි දෙනෙකුට පහසුවෙන් රැකියාගතවීමට හැකි නිසා ඔවුන් සතියේ දින වල රැකියාවේ යෙදෙමින් සති අන්තයේ උපාධිය හැදෑරීමට පෙළඹේ. ඒ නිසා සති අන්තයේ වැඩි සිසුන් සංඛ්‍යාවක් බඳවාගන්නා ලදී. සතියේ දින පාඨමාලා සඳහා ඉල්ලුම් කළ, සුදුසුකම් සැපිරූ සියලුම අයදුම්කරුවන්ට උපාධිය හැදෑරීමට අවස්ථාව ලබා දී ඇති අතර, අනෙකුත් වෘත්තීය අධ්‍යයන හා පුහුණු කිරීමේ ආයතන වලින් පිටවන NVQ ඩිප්ලෝමාධාරීන්ගේ සංඛ්‍යාව අඩුවීම මෙම ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීමට හේතු වී ඇත. 2017 වෂර්යේ සිට උසස් පෙළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සහිත සිසුන්ද බඳවා ගැනීමේ සුදුසුකමක් වශයෙන් සලකන බවට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බැවින්, 2017 වෂර්යේ සිට සතියේ දින හා සති අන්ත උපාධි පාඨමාලා සඳහා සිසුන්ගේ ඉල්ලීම අනුව බඳවා ගැනීම සිදු වේ.
(iii)	එක් එක් පාඨමාලාව සඳහා බඳවා ගතහැකි අවම සිසුන් සංඛ්‍යාව හෝ බඳවා නොගැනීම හේතුවෙන්, සමාලෝචිත වෂර්ය තුළ පවත්වන ලද පාඨමාලා 09 ක සිසුන් බඳවාගැනීම වෙන් වෙන්ව සැලකීමේදී සිසුන් බඳවා නොගැනීම සියයට 23 සිට සියයට 100ක අවම මට්ටමක පැවතුණි.	ජාතික වෘත්තීය සුදුසුකම් 5 ලබා ගන්නා සිසුන් බොහෝ දෙනෙකු ඉක්මනින් රැකියා ගත වන බැවින් ඔවුන් රැකියාවේ නියුක්ත වන අතර ඉගෙනීමට වැඩි කැමැත්තක් දක්වයි. එබැවින් සතිඅන්ත පාඨමාලා සඳහා, ජාතික වෘත්තීය සුදුසුකම් 5 සහිත සිසුන්ගෙන් වැඩි ඉල්ලුමක් පවතී. සිසුන්ගේ ඉල්ලුමට ගැලපෙන අයුරින් පාඨමාලා ක්‍රියාත්මක කර ඇති බැවින් සති අන්තයේ සියළුම පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබන අතර මෙමගින් රැකියාව කරන අතරම උපාධියක් ලබා

		ගැනීමට අවස්ථාව සලසා දී ඇත. මේ අනුව විශ්වවිද්‍යාලයේ අදාල අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කර ඇති බව පැහැදිලි වේ.
(iv)	සමාලෝචිත වෂර්ය තුළ විශ්වවිද්‍යාලයට බඳවාගත් සිසුන්ගේ පාඨමාලා හැරයාමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. ඒ අනුව පාඨමාලා 11 ක් සඳහා බඳවා ගත් සිසුන් 342 දෙනෙකුගෙන් සිසුන් 98 දෙනෙකු වෂර්ය තුළ පාඨමාලා හැරගොස් තිබුණු අතර පාඨමාලා වෙන් වෙන්ව සැලකීමේදී හැරයාමේ ප්‍රතිශතය සියයට 12 සිට සියයට 67 දක්වා වූ පරාසයක පැවතුණි. මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාගර් ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.	මෙම විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වන සිසුන්ගෙන් සමහර සිසුන් පළමු සෙමෙස්තර පරීක්ෂණය සඳහාවත් පෙනී නොසිට පාඨමාලාව අතරමැද හැරයාම සිදු වේ. තවත් කොටසක් සෙමෙස්තර කීපයක පරීක්ෂණ සඳහා පෙනී සිට පසුව පාඨමාලාව අතරමැද හැරයාම සිදු වේ. තවත් කොටසක් සෙමෙස්තර පරීක්ෂණයන්ගෙන් විෂයන් කීපයක් අසමත් වීම නිසා නැවත විභාග (Repeat exam) සඳහා ඉදිරිපත්ව සිය උපාධිය සම්පූණර් කර ගැනීම සිදු වේ. සමහර සිසුන්, ප්‍රථමවරට ලියාපදිංචි වූ වෂර්යේදී පෞද්ගලික හේතු මත සිය අධ්‍යයන කටයුතු අඛණ්ඩව කරගෙන යා නොහැකි වීම නිසා ශිෂ්‍ය ලියාපදිංචිය අඛණ්ඩව පවත්වාගෙන ගොස්, ඊලඟ වෂර්යක ලියාපදිංචි වූ සිසුන් කණ්ඩායමක් සමග නැවත සිය අධ්‍යයන කටයුතු පවත්වාගෙන ගොස් උපාධිය සම්පූණර් කිරීමද සිදු වේ. වැඩිහිටි අධ්‍යාපනයේදී(Adult education) තම පෞද්ගලික හේතු මත සිය අධ්‍යාපන කටයුතු අතරමැද හැරයාම සාමාන්‍ය තත්ත්වයකි.
(ඇ)	<u>ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම</u>	
(i)	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතට අනුව විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා පිළිගත හැකි සුදුසුකම් ඇති මධ්‍යම මට්ටමේ කාමර්ික නිළධාරීන් සඳහා අධ්‍යන පාඨමාලා සැපයීම විශ්වවිද්‍යාලයේ අරමුණක් වුවද ආංශික නිපුණතා සංවධර්න ව්‍යාපෘතිය මගින් පවත්වනු ලබන ඩිප්ලෝමා පාඨමාලාව (National Diploma in Technical Teacher Education) හැර වෙනත් ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2015 වෂර්යේ සිසුන් බඳවා ගෙන නොතිබුණු අතර 2016 වෂර්ය වෙනුවෙන් කිසිදු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා සිසුන් බඳවා ගෙන නොතිබුණි.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කායර්භාරය වනුයේ උපාධි මට්ටමේ (NVQ 7) පාඨමාලා පැවැත්වීම බැවින් ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ නොකිරීමට පාලනාධිකාරිය මගින් තීරණය කරන ලදී. ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා පැවැත්වීම විශ්වවිද්‍යාල විද්‍යායතන මගින් සිදු කෙරේ. කාමර්ික සහ වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධ ආයතන වල ගුරුවරුන් සඳහා වන National Diploma in Technical Teacher Education පාඨමාලාව පමණක් පැවැත්වේ. 2015 වෂර්යේ පැවති NDTPT, NDTPP සහ NDQS යන ඩිප්ලෝමා පාඨමාලා වෙනුවට එම විෂයන්ට අදාල උපාධි පාඨමාලා ආරම්භ කර පවත්වාගෙන යාම සිදු වේ..

(ii)	විශ්වවිද්‍යාලය මගින් 2013 වෂර්යේ පවත්වනු ලැබූ ජාතික වෘත්තීය සුදුසුකම් 05 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා 02 ක් සඳහා එම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2016 වෂර්ය අවසානය වනවිටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබීමෙන් පාඨමාලා හැදෑරූ සිසුන් වෙත ගුණාත්මකභාවයෙන් යුත් පාඨමාලා ලබා දීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.	National Diploma in Technical & Vocational Education:- මෙම ඩිප්ලෝමා පාඨමාලාව සඳහා NVQ 5 මට්ටම ලබා දීම සම්බණ්ධව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමග සාකච්ඡා කර, මෙම පාඨමාලාව NVQ මට්ටම සහිත පාඨමාලාවක් බවට, TVEC ආයතනය මගින් ප්‍රතීතනය කරන ලදී. ඒ අනුව මෙම පාඨමාලාව ආරම්භ කර පවත්වා ගෙන ගිය අතර සාථර්කව අවසන් කල සිසුන් හට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් ඩිප්ලෝමා සහතික පත් නිකුත් කරන ලදී. මෙම සිසුන් වෙත TVEC ආයතනය මගින් නිකුත් කරන NVQ 5 මට්ටම ට අදාල සහතිකය ලබා දීම සඳහා TVEC ආයතනය මගින් ඇගයීම් කටයුතු මේ දිනවල සිදු කරමින් පවතී. ඇගයීම් කටයුතු සාථර්කව සිදු කිරීමෙන් පසුව NVQ 5 මට්ටමට අදාල සහතිකපත් TVEC ආයතනය මගින් සිසුන් වෙත නිකුත් කෙරෙනු ඇත. National Diploma in English: - මෙම ඩිප්ලෝමා පාඨමාලාව 2013 වෂර්යේ සිට මෙම විශ්වවිද්‍යාලයේ නොපවත්වන බැව් දැනුම් දෙමි. B.Ed (ELT) උපාධි පාඨමාලාව හදුන්වා දී ඇත.
(iii)	ඩිප්ලෝමා පාඨමාලා සමත් සිසුන් පිළිබඳ පරීක්ෂාවේදී පාඨමාලා 03ක් හැර අනෙකුත් පාඨමාලා සමත් වීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවති අතර එය සියයට 07 සිට සියයට 47 දක්වා වූ පරාසයක පැවතිණි. එම පාඨමාලාවලින් අසමත් වන සිසුන් සම්බන්ධයෙන් නැවත විභාග පැවැත්වීමේ දීඝර් ප්‍රමාදයක් පැවති අතර පාඨමාලා අඛණ්ඩව පවත්වා නොතිබීම මීට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.	මෙම ඩිප්ලෝමා පාඨමාලා හදාරන ලද සමහර සිසුන් අවසන් විභාගයේ එක් විෂයක් අසමත් වීමෙන් මුළු විභාගයම අසමත් වීම, අඛන්ඩ ඇගයීම් ලබා නොදීම, කමර්ාන්ත ගත පුහුණුවෙහි පුහුණු වාතර්ා ලබා නොදීම, ආදි හේතු නිසා පළමුවර විභාගය අසමත් විය. ඉන්පසු නැවත විභාගයේදී (repeat exam) මෙයින් බොහෝ සිසුන් සංඛ්‍යාවක් සිය ඩිප්ලෝමා අවසන් විභාගය සමත් වූ අතර 2016 වෂර්යේ ඩිප්ලෝමා ප්‍රධානෝත්සවයේදී ඩිප්ලෝමා සහතික ලබා ගන්නා ලදි. ඒ සම්බන්ධ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

		ඩිප්ලෝමාව / ආරම්භ කල දිනය / විභාගය සඳහා ඉදිරිපත් වූ මුළු සිසුන් ගණන / සමත් වූ මුළු සිසුන් ගණන / සමත් වූ සිසුන් ගණන ප්‍රතිශතයක් ලෙස NDTPT — 2013.02.02 — 26 — 12 — 46% NDPPT — 2013.02.02 — 28 — 17 — 61% NDQS – 2013-2015 — 2013.03.03 — 35 — 29 — 83% 2014-2016 — 2014.05.03 — 41 — 22 — 54% මෙම පාඨමාලාවන්ට අදාල නැවත විභාගය 2016 වෂර්යේ පැවති අතර ඉල්ලා ඇති සියළුම සිසුන් විභාගයට පෙනී සිට ඇත. ඉන්පසු කිසිදු ඉල්ලීමක් සිසුන්ගෙන් සිදු නොවූ අතර මීට කලින් වසර වල පැවති සියලුම ඩිප්ලෝමා පාඨමාලාවන්හි ඉතිරි වී සිටින සිසුන් ඇත්නම් එම සියලුම සිසුන් වෙනුවෙන් එක් නැවත විභාගයක් (repeat exam) පැවැත්වීමට තීරණය කර ඇත. මෙම ඩිප්ලෝමා පාඨමාලා වතර්මානයේ මෙම විශ්වවිද්‍යාලය තුල නොපැවැත්වේ.
(ඇ)	**<u>නිපුණතා ආංශික සංවධර්න වැඩසටහන (SSDP) ක්‍රියාත්මක කිරීම.</u>**	
	වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක වන නිපුණතා ආංශික සංවධර්න වැඩසටහන යටතේ 2016 වෂර්ය වෙනුවෙන් විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් 10 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 254.2 ක් වෙන් කර තිබුණු අතර විශ්වවිද්‍යාලය ඉන් ක්‍රියාකාරකම් 08 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 157.4 ක් වැයකර	

	තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.	
(i)	රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව විශ්වවිද්‍යාල විද්‍යායතන පිහිටුවීම හා NVQ 5,6 මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් (Establish private and PPP University colleges to offer demand – driven NVQ 5,6 level training programs) සමාලෝචිත වෂර්ය තුළ රු. මිලියන 01 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද, අදාළ කායර්යන් ඉටුකර නොතිබුණි.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ එකඟතාවයකින් තොරව, නිපුණතා ආංශික සංවධර්න වැඩසටහනෙහි ක්‍රියාකාරී සැලැස්ම තුලට මෙම කටයුත්ත අන්තගර්ත කර ඇත. PPP Colleges, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති ආයතන නොවේ. මෙම විශ්වවිද්‍යාලය සමග නීතිමය සම්බන්ධතාවයක් නොමැති එවැනි ආයතන වෙනුවෙන් මුදල් වියදම් කිරීම මෙම විශ්වවිද්‍යාලයට කල නොහැක.
(ii)	පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතන වල කායර් මණ්ඩලය ද ඇතුලත්ව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කායර් මණ්ඩලයේ නිලධාරීන් 17 දෙනෙකු සඳහා රු. මිලියන 17 ක මුදලක් වෙන්කර තිබුණද සමාලෝචිත වෂර්ය තුළ දී, කිසිදු නිලධාරියෙකුට පශ්චාත් උපාධි සුදුසුකම් සඳහා මූල්‍ය සහාය ලබාදී නොතිබුණු අතර එම මුදලින් පසුගිය වෂර්යේ ප්‍රතිපාදන ලබාදී තිබූ නිලධාරීන් 05 දෙනා වෙනුවෙන් රු. මිලියන 10.7ක් වැය විය කර තිබුණි.	පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා විශ්වවිද්‍යාල හා විශ්වවිද්‍යාල විද්‍යායතන කායර් මණ්ඩලය වෙතින් අයදුම්පත් කැඳවූ අතර පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයක ලියාපදිංචිය සහිතව ඉල්ලුම්කරන ලද සියළුම අයදුම්කරුවන් වෙත මෙම අවස්ථා ලබා දුන් අතර, ඊට අවශ්‍ය මුදල් වියදම් කරන ලදී. පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රමාණවත් සුදුසුකම් සහිත ආචාර්ය වරුන්ගේ හිඟයක්ද මෙම විශ්වවිද්‍යාලය තුල පවතී. ඇස්තමේන්තු ගතකරන ලද පාඨමාලා ගාස්තු වලට වඩා, සත්‍ය වශයෙන් වැය කිරීමට සිදු වූ නිසා එම නිලධාරීන් 05 දෙනා වෙත පශ්චාත් උපාධි අවස්ථා ලබා දීම සඳහා ඇස්තමේන්තු කරන ලද අගයට වඩා වැය කිරීමට සිදු විය. මෙය විශ්වවිද්‍යාලයේ මානව සම්පත් සංවධර්නය සඳහා කරන ලද දිගුකාලීන ආයෝජනයකි. විශ්වවිද්‍යාලයක අධ්‍යයන කායර්ය මණ්ඩලය සංවධර්නය සඳහා කරනු ලබන ආයෝජනය, මුදල් වටිනාකමින් පමණක් සැලකිල්ලට ගැනීම සාධාරණ නොවේ.
(iii)	ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 සඳහා තෘතීය හා අධ්‍යාපනික පුහුණුව (NVQ 5 for TVET Trainer) ලබාදීම සඳහා සමාලෝචිත වෂර්ය තුල රු.මිලියන 06 ක් වෙන්කර තිබුණද, ඉන් රු. මිලියන 4.94 ක් වැය කර තිබුණේ 2015 වෂර්යේ	2015 වෂර්යේ දෙසැම්බර් මාසයේ දී 238 දෙනෙකු ද 2016 වෂර්යේ නොවැම්බර් මාසයේ දී පුහුණු ලාභීන් 152 දෙනෙකුද ඉහත සඳහන් පුහුණුවට බඳවාගෙන ඇත.

	බඳවා ගත් පුහුණු ලාභීන් 238 දෙනෙකු වෙනුවෙනි. 2016 වෂර්ය තුළදී පුහුණු ලාභීන් බඳවා ගැනීමක් සිදු කර නොතිබුණි.	
(iv)	පිළිගත් විශ්වවිද්‍යාලවල මඟපෙන්වීම යටතේ විෂයමාලා සංවධර්නය (Develop Curricula with Industry Inputs and Guidance from Reputed Universities) කිරීම වෙනුවෙන් ප්‍රතිපාදිත රු. මිලියන 01ක මුදලින් රු.මිලියන 0.39 ක් වැය කර හෝටල් කළමනාකරණ උපාධි පාඨමාලාව පමණක් සංවධර්නය කර තිබුණි.	හෝටල් කළමනාකරණය සඳහා කැනඩා ලෝක විශ්වවිද්‍යාල සේවය අප හට ආධාර කළ බැවින් ඒ සඳහා යන වියදම අවම විය. අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ මූලික විශයමාලාව සැකසීම ජර්මනියේ ‘‘කයිසස්ලවුටන්’’ තාක්ෂණික විශ්වවිද්‍යාලයේ (University of “Kaiserslautern”) උපදේශකවරයෙකුගේ සහය ඇතිව, පුහුණු තාක්ෂණ පීඨයේ අධ්‍යාපන හා පුහුණු අධ්‍යයන අංශයේ සහභාගීත්වයෙන් සැකසුණු අතර ඒ සඳහා ජර්මනියේ උපදේශකත්වය නොමිලේ ලැබුණි. ආහාරපාන හා සංග්‍රහ කටයුතු සඳහා පමණක් විශ්වවිද්‍යාලය මගින් දරන ලදී. එබැවින් ඇස්තමේන්තු කරන ලද මුදලට වඩා අඩු මුදලක් වැය විය.
(v)	විශ්වවිද්‍යාල විද්‍යායතනවල අධ්‍යන හා පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම (Establish mechanism to monitor academic and administrative quality in university colleges) වෙනුවෙන් ප්‍රතිපාදිත රු.මිලයන 5.5ක මුදලින් රු.මිලියන 5.496 ක් වැයකර විශ්වවිද්‍යාලය සඳහා Video Conference system ක් ලබාගෙන තිබුණ ද විශ්වවිද්‍යාලය යටතේ පවත්නා විද්‍යායතනවල එවැනි පද්ධති සවිකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. අමාත්‍යාංශයේ හා විද්‍යායතනයන්හි Video conference system සඳහා වෂර්ය තුළ ප්‍රතිපාදිත රු.මිලියන 20 උපයෝජනය කර නොතිබුණි.	විශ්වවිද්‍යාලයට Video Conference system එකක් මිලදී ගන්නා ලද්දේ විදේශීය විශ්වවිද්‍යාල සහ ආයතන සමග සාකච්ඡා හා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහාය. එසේම එය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. මේ නිසා ඒ සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන වෙනත් අවශ්‍ය ව්‍යාපෘති සඳහා යොදාගැනීමට ද තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතියේ සාථර්කත්වය මත ඉදිරි වසරේ යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනයට Video Conference system එකක් ලබාදීමටද තීරණය කර ඇත.
4.2	**කළමනාකරණ ක්‍රියාකාරකම්**	

	විශ්වවිද්‍යාලය සඳහා 2015 වෂර්යේ සකස් කරන ලද ආයතන සංග්‍රහය සමාලෝචිත වෂර්යේ අවසාන දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය කළමනාකරණ සේවා දෙපාතර්මේන්තු අනුමැතිය ලබාගෙන නොතිබුණි.	
4.3	**මෙහෙයුම් ක්‍රියාකාරකම්**	
(අ)	**උපාධි පාඨමාලා සඳහා බාහිර දේශකයින් පත් කිරීම.**	
(i)	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අන්තග්‍රර්හණය කරන ලද සුදුසුකම් සපුරා නොතිබූ අධ්‍යයන කායර් මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුට 2010 අගෝස්තු 09 සිට වෂර් 01 මාස 09 දින 22ක කාලපරිච්ඡේදයක් සඳහා පශ්චාත් අධ්‍යයන කටයුතු වෙනුවෙන් විදේශ ශිෂ්‍යත්ව එකවර පිරිනමා තිබුණි. ඒ හේතුවෙන් එම කාලපරිච්ඡේදය තුල විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සඳහා බාහිර දේශක වියදම් ලෙස 2011 හා 2012 වෂර්වලදී පිළිවෙලින් රු. 2,799,119ක හා රු.5,210,428 ක අමතර පිරිවැයක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදු වී තිබුණි.	ශ්‍රී ලංකා ජාතික කාමර්ික අධ්‍යාපන ආයතනයේ කායර්ය මණ්ඩලය මෙම විශ්වවිද්‍යාලය ආරම්භයත් සමගම විශ්වවිද්‍යාලය වෙත අන්තග්‍රර්හණය කරන ලදි. මෙම අධ්‍යයන කායර් මණ්ඩලය විශ්වවිද්‍යාලයක අධ්‍යයන කායර්ය මණ්ඩලයක මට්ටමට සුදුසුකම් සහිත අය නොවේ. විශේෂයෙන්ම විශ්වවිද්‍යාලයක අධ්‍යයන කායර් මණ්ඩලය විදේශීය විශ්වවිද්‍යාලයක අත්දැකීම් සහිත වූවන් වීම අත්‍යවශ්‍යය. ඒ සඳහා ආරම්භයේදීම කටයුතු කිරීම මගින් ලැබෙන ප්‍රතිලාභය බාහිර කථිකාචාර්යවරුන් වෙත මුදල් වැය කිරීමට වඩා මානව සම්පත් සංවධර්නය කිරීම ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස සලකා කටයුතු කර ඇත. මෙම පුහුණු වැඩසටහන් විශ්වවිද්‍යාලයීය නිවාඩු හා ප්‍රදාන කමිටුවේ නිදෙර්ශ සහිතව පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත. උක්ත විදේශ පුහුණු සඳහා වියදම් කාමර්ික අධ්‍යාපන සංවධර්න ව්‍යාපෘතිය (TEDP) මගින් දරා ඇත. විශ්වවිද්‍යාලයක ආරම්භයේ දී අධ්‍යයන කායර්මණ්ඩලයේ සුදුසුකම් වැඩි දියුණු කර ගැනීමට ඕනෑම විශ්වවිද්‍යාලයක් ප්‍රමුඛතාවය දෙනු ලැබේ. මෙමගින් විශ්වවිද්‍යාලයේ පාඨමාලාවල ප්‍රමිතිය වධර්නය වේ.

(ii)	2013 වෂර්යේ දී කථිකාචාර්ය (ආධුනික) තනතුර වෙනුවෙන් 17 දෙනෙකු සඳහා උසස්වීම් ලබා දී තිබුණ ද එම වෂර්යෙදී බාහිර දේශක වියදම් රු. 8,043,300 ක ඉහළ අගයක් ගෙන තිබුණු අතර එය පෙර වෂර්යේ බාහිර දේශක ගෙවීම වූ රු.5,210,428 සමඟ සැසඳීමේදී සියයට 54 ක වැඩිවීමකි.	මෙම විශ්වවිද්‍යාලයේ 2010 වෂර්යේ සතිඅන්ත පාඨමාලා පමණක් ආරම්භ කල අතර, 2012 වෂර්යේ සතියේ දින පාඨමාලා පමණක් ආරම්භ කරන ලදී. 2013 වෂර්යේ සිට සතියේ දින හා සතිඅන්ත යන උපාධි පාඨමාලා කාණ්ඩ දෙකම ආරම්භ කල අතර නව උපාධි පාඨමාලා හඳුන්වා දීමද සිදු විය. ඒ අනුව 2010 වෂර්යේ අධ්‍යයන කටයුතු ආරම්භ කල මෙම විශ්වවිද්‍යාලය තුළ 2013 වන විට වෂර් 3 ක සිසුන් වෙත උපාධි පාඨමාලාවන් හි ඉගැන්වීම් කළ යුතු නිසාවෙන් පැවති අධ්‍යයන කායර් මණ්ඩලය ප්‍රමාණවත් නොවන නිසා හා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීම අත්‍යාවශ්‍ය නිසා මෙසේ භාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම කරන ලදී. මෙම විගණන විමසුමෙහි පෙන්වා ඇති කථිකාචාර්ය (ආධුනික) තනතුර ලබා දුන් 17 දෙනා මෙම විශ්වවිද්‍යාලය තුළ ගුරුසහකාරවරුන් වශයෙන් අධ්‍යයන කායර් මණ්ඩලය තුළ සේවය කරන ලද නිළධාරීන් වේ. එබැවින් තනතුරු නාම වෙනස් වුවද කථිකාචාර්ය් වරුන්ගේ සංඛ්‍යාව වෙනස් වී නොමැත.
(iii)	සමාලෝචිත වෂර්යේදී උපාධි පාඨමාලා සඳහා බාහිර දේශකයින්ගේ දායකත්වය එක් එක් උපාධි පාඨමාලා සඳහා නිදේර්ශිත මුළු දේශන පැය ගණනින් සියයට 55 ක් විය. වෂර්ය තුළ බාහිර දේශක ගෙවීම් ලෙස රු.17,266,578 ක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදුව තිබුණු අතර එය 2015 වෂර්යට සාපෙක්ෂව රු. 6,874,366 ක වැඩිවීමකි. ඒ අනුව විශ්වවිද්‍යාලය පවත්වනු ලබන පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල අධ්‍යයන කායර් මණ්ඩලයේ දායකත්වය අවම මට්ටමක පැවතුණි.	මෙම විශ්වවිද්‍යාලයේ පවත්නා උපාධි පාඨමාලාවන්හි ඉගැන්වීම් කටයුතු සඳහා ප්‍රමාණවත් අධ්‍යයන කායර් මණ්ඩලයක් නොමැති බැවින්, ක්ෂේත්‍රයේ පලපුරුද්ද හා නිපුණතාවය සහිත ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීම තුලින් හිඟය පියවා ගැනීම සිදු වේ.
(ආ)	“ශ්‍රී ලංකාවෙහි විශ්වවිද්‍යාල පද්ධතියෙහි අධ්‍යයන කායර් මණ්ඩලය සඳහා වන අචාරධමර් හා අධ්‍යයන වගවීම” මැයෙන් 2015 මැයි 07 දිනැති අංක UGC/AC/QA Gen දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව අධ්‍යයන කායර් මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාලය තුල ආචාර ධමර් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණු බැවින් එමඟින් අධ්‍යයන කායර් මණ්ඩලයෙන් වඩා කායර්ක්ෂම හා ඵලධායී දායකත්වයක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.	ඒ අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඇ)	පයෙර්ෂණ දීමනා ගෙවීම	
(i)	2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා දෙපාතර්මේන්තු චක්‍රලේඛයේ 4(ii) ඡේදයට ප්‍රකාරව පයෙර්ෂණ වාතර්ාවෙහි ප්‍රගතිය දක්වමින් පයෙර්ෂණ කටයුතු ආරම්භ කළ දින සිට මාස 6 ක් ඇතුලත කමිටුව වෙත අතුරු වාතර්ාවක් ඉදිරිපත් කළ යුතු අතර, නිලධාරීන් එසේ වාතර්ා ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට මෙම චක්‍රලේඛය අනුව ක්‍රියාත්මක වේ.
(ii)	පයෙර්ෂණයන් සිදු කිරීම වෙනුවෙන් නිලධාරියෙකු වෙත 2015 වෂර්යේ මාතර්ු සිට 2016 සැප්තැම්බර් දක්වා පයෙර්ෂණ දීමනා ලෙස රු.469,523ක් ගෙවා තිබුණ ද 2017 අගෝස්තු 27 දින වන විටත් ඉහත චක්‍රලේඛයේ 4(iii) ඡේදය ප්‍රකාරව අවසාන පයෙර්ෂණ වාතර්ාව ඉදිරිපත් කර නොතිබුණි.කෙසේ වුවද මෙම නිලධාරියා 2016 සැප්තැම්බර් 13 දින විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත්ව ගොස් තිබුණි.	මෙම පයෙර්ෂණය සඳහා යොමු වී ඇත්තේ හිටපු උපකුලපතිතුමාය. එම පයෙර්ෂණයේ කාල සීමාව වසර දෙකකි. අදාල වසර දෙකක කාල සීමාව අවසන් වීමට ප්‍රථම එතුමා මෙම විශ්වවිද්‍යාලයීය සේවයෙන් ඉවත් වන ලදි.
4.4	නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්	
	විශ්වවිද්‍යාල සතු අධ්‍යක්ෂ ජනරාල් නිල නිවස 2012 නොවැම්බර් සිට සමාලෝචිත වෂර්ය අවසානය දක්වා ප්‍රයෝජනයට නොගෙන නිශ්කායර්ව පැවතුණි.	මෙම නිල නිවස අළුත්වැඩියා කෙරෙමින් පවතී. අළුත්වැඩියා කටයුතු අවසන් වූ පසුව එතුමිය නිල නිවසෙහි පදිංචියට පැමිණෙනු ඇත.
4.5	කොන්ත්‍රාත් ක්‍රියාවලිය	
	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීම, ආයතනයේ ධාරිතාව වැඩිකිරීම, ඉගෙනුම් පරිසරය හා පශ්චාත් උපාධි පැවැත්වීම අරමුණු කර ගනිමින් උපකරණ සඳහා රු.මිලියන 150 ක්ද ඇතුළත්ව රු.මිලියන 359.9 ක පිරිවැයකට ඉදිකිරීමට යෝජිතව තිබූ ඉගෙනුම් සම්පත් සංවධර්න මධ්‍යස්ථානය (Learning Resources Development Centre) සඳහා මූලික වශයෙන් 2011 වෂර්යේදී රු.මිලියන 17.9 ක් හා ඉතිරි මුදල් 2012 වෂර්යේ සිට වෂර් 03 ක් දක්වා වාෂිකීකව ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් ලබාදීමටත් අනුමැතිය ලැබී තිබුණි. එම ප්‍රතිපාදන ඇතුලත මුදල් කළමනාකරණය කර ගනිමින් ගොඩනැඟිලි සංකීණර්යේ ඉදිකිරීම් කටයුතු සිදුකල යුතු බවට අංක. අමප /11/2152/539/017-1 දරන අමාත්‍ය මණ්ඩල	මේ සඳහා අවශ්‍ය සැලසුම් අමාත්‍යාංශය වෙත කිහිපවතාවක්ම අනුමැතිය සඳහා යැවූවද ගරු අමාත්‍යතුමා වෙනස් වීම, අමාත්‍යාංශ ලේකම්තුමා වෙනස් වීම ආදී කරුණු අනුව කැබිනට් අනුමැතිය ලබා ගැනීම කල්යැවීමට හේතු විය. නමුත් මෙහි තිබෙන පංති කාමර සියල්ලම දේශණ සඳහා යොදවා ගන්නා ලද අතර, මැදිරි සංකීණර්ය පමණක් අවසන් කළ නොහැකි විය. 2017 වසරේදී එහි සියළු කටයුතු නිමකිරීම සඳහා අවශ්‍ය සියළුම කටයුතු සම්පාදනය කර ඇත.

	තීරණය මගින් දන්වා තිබුණි. 2016 වෂර්ය අවසානය වනවිට ඉදිකිරීම් වෙනුවෙන් රු.මිලියන 206.5 ක් වැය කර තිබුණද අනුමත ප්‍රතිපාදනය ඉක්මවූ රු.මිලියන 75 ක මැදිරි සංකීණර්යේ අතිරේක වැඩ සඳහා වූ වියදම සඳහා කැබිනට් අනුමැතිය නොලැබීම හේතුවෙන් 2016 වෂර්ය තුල ඉදිකිරීම් කටයුතු කල නොහැකි වී තිබුණි. කෙසේ වුවද නිසි සැලසුමකින් හා කායර්ක්ෂමතාවයකින් යුක්තව කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වී තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.	
4.6	<u>කායර් මණ්ඩල පරිපාලනය</u>	
(අ)	කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ජුලි 27 දිනැති අංක DMS/E4/47/2/280/1 දරන ලිපියට පටහැනිව 2012 ඔක්තෝම්බර් 12 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට කායර් මණ්ඩල අන්තගර්හණය කිරීමේ දී අධ්‍යයන කායර් මණ්ඩලයේ 10 දෙනෙකු අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව තනතුරට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබිය දී දරන්නාට පෞද්ගලික වන සේ තනතුරු වල පිහිටුවා තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුවේ අනුමැතියක් ලබා නොතිබුණි. එසේම ඉන් කථිකාචාර්යවරුන් 05 දෙනෙකුගේ පවත්නා සුදුසුකම් අදාල විශ්වවිද්‍යාල වලින් සනාථ කරගෙන නොතිබුණි.	එවකට පැවති විශ්වවිද්‍යාලයීය කළමණාකාරීත්වයේ තීරණයක් මත එසේ අධ්‍යයන නිලධාරීන්, දරන්නාට පෞද්ගලික වන සේ අධ්‍යයන තනතුරු සඳහා 08 දෙනෙකු අන්තගර්හණය කොට ඇත. අදාල රාජකාරීද ඉටුවනුයේ පරිපාලන අංශය හරහාය. විශ්වවිද්‍යාලයට අලුතින් බඳවා ගන්නා නිලධාරීන්ගේ අධ්‍යාපන සහතික පත්‍ර සනාථ කරවා ගැනීම සිදු කරන නමුත් දැනට පෞද්ගලික ලිපි ගොනු ආශ්‍රිත සියලු රාජකාරී එක් කළමණාකරන සහකාර නිලධාරිනියකගෙන් සිදුවන බැවින් රාජකාරි බහුලතාව මත මෙසේ දැනට විශ්වවිද්‍යාලයේ සිටින අන්තගර්හණය කරන ලද සියළු නිලධාරීන්ගේ සහතික පත්‍ර සනාථ කිරීම සිදු කිරීමට නොහැකි වී ඇත. යථා කාලයේ එම කායර්ය සම්පූණර් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
(ආ)	දරන්නාට පුද්ගලික වනසේ ජ්‍යෙෂ්ඨ ගුරු සහකාර තනතුරේ පිහිටුවා තිබුණු කථිකාචාර්යවරයකු කාමරීක අධ්‍යාපන සංවධර්න ව්‍යාපෘතිය යටතේ විදේශ ශිෂ්‍යත්වයක් ලැබ පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා තායිලන්තයට ගොස් තිබුණද නියමිත කාලය තුල පශ්චාත් උපාධිය සම්පූණර් කර නොතිබුණු	අදාල නිලධාරියා එම පශ්චාත් උපාධිය 2012 ජුනි 01 දිනට සම්පූණර් කළ යුතු වූ අතර 2011 දෙසැම්බර් මාසයේ වෛද්‍ය හේතු මත නැවත ශ්‍රී ලංකාවට පැමිණ තිබුණි. වෛද්‍ය සහතික ඉදිරිපත් කොට ඔහු තායිලන්ත උසස් අධ්‍යාපන ආයතනයේ සිය අධ්‍යයන වාර කල්

	අතර එම ශිෂ්‍යත්වය වෙනුවෙන් වැය කල රු. 3,876,544 ක් හා අතිරේක අධ්‍යයන වියදම් ලෙස බාත් 154,503.43ක් (රු. 34,170) අය කරවා ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	දමාගෙන තිබූ අතර 2012.12.31 දින සිට විශ්වවිද්‍යාලයේ සේවයට වාතර්ා කරන ලදි. 2017 දෙසැම්බර් මාසයේ මෙම පශ්චාත් උපාධිය අවසන් කර අදාළ සහතික පත්‍රයේ සහතික කරන ලද සත්‍ය පිටපතක් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ලබා දී ඇත.
(ඇ)	අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොතිබියදී හා පවත්නා සුදුසුකම් අදාල විශ්වවිද්‍යාල මඟින් තහවුරු කර ගැනීමකින් තොරව ගුරු සහකාර නිළධාරියෙකු 2013 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තොරතුරු තාක්ෂණික අංශයේ කතිකාචාර්ය (ආධුනික) තනතුරට පත් කර තිබුණි.	මෙම නිලධාරිනිය තොරතුරු තාක්ෂණය සම්බන්ධව පශ්චාත් උපාධිය 2012.01.01 දින ලබා ඇති අතර, 2008.04.07 දින සිට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පූවර් ආයතනය වන ශ්‍රී ලංකා ජාතික කාමීර්ක අධ්‍යාපන ආයතනයේ සහකාර කථිකාචාර්ය වරියක් වශයෙන් සේවය කර ඇත. 2013 අගෝස්තු මාසයේදී පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී, අවශ්‍ය සුදුසුකම් පරීක්ෂා කර බලා කථිකාචාර්ය ආධුනික තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බැවින් ඇයව එම තනතුරට පත් කර ඇත. ඒ අනුව ඇය බඳවාගැනීම් පටිපාටියට අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත. අදාල විශ්වවිද්‍යාල මඟින් සහතික සනාථ කර ගැනීම 2013 වෂර්යේදී සිදු කර නොතිබුණ අතර මේ වන විට අදාල සනාථ කර ගැනීම් කර ඇත.
(ඈ)	ඉන්දියාවෙහි විශ්වවිද්‍යාලයක වෂර් 2 ක පශ්චාත් උපාධිය සම්පූණර් කර තිබුණු කථිකාචාර්වරයෙකුගේ උපාධිය හා ප්‍රතිඵලවල වලංගුතාවය එම විශ්වවිද්‍යාලයෙන් තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම නිලධාරිනිය ආධුනික කථිකාචාර්ය තනතුරට පත් කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත්තේ කැළණිය විශ්වවිද්‍යාලයෙන් ලබා ගෙන ඇති පංති සාමාථර්ය සහිත ප්‍රථම උපාධිය පමණි. එබැවින් ඇයගේ අදාල පශ්චාත් උපාධිය පිළිබඳ සැලකීමක් කොට නැත. ඉදිරියේදී අදාල විශ්වවිද්‍යාල වලින් සහතික සනාථ කර ගැනීම කරනු ලැබේ.
(ඉ)	විශ්වවිද්‍යාලයේ අනුමත බඳවාගැනීමේ පටිපාටියෙහි 5.4(i) ඡේදයට අනුව අධ්‍යයන කාණ්ඩයට අයත් තනතුරුවලට බඳවා ගැනීමේ දී හා උසස් කිරීමේදී එම පටිපාටියට අනුකූල විය යුතු බව දක්වා තිබියදී ඊට පටහැනිව ගොඩනැගිලි සේවා තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී පාඨමාලාව සඳහා පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූණර් කර නොතිබුණු කථිකාචාර්වරියක 2016 ජුනි 01 දින සිට කථිකාචාර්(ආධුනික) තනතුරට බඳවාගෙන තිබුණි.	අදාල තනතුර පිළිබඳව නීතිපති උපදෙස් ද ලබාගෙන ඇති අතර නිවැරදි කිරීමේ පියවර වලට යොමු වී තිබේ.

(ඊ)	සහකාර මූල්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගැනිමේ පරිපාටියේ 5.4.1ඡේදය අනුව පවත්නා පුරප්පාඩු වලින් සියයට 60 ක් බාහිර අයදුම්කරුවන් වෙතින් බඳවා ගත යුතු වුවද, ඊට පටහැනිව අනුමත කායර් මණ්ඩලයේ පැවති පුරප්පාඩු තනතුරු 3 සඳහා අභ්‍යන්තර නිලධාරීන් බඳවාගෙන තිබුණි.	විශ්වවිද්‍යාලයේ අනුමත කායර්මණ්ඩලයේ සහකාර මූල්‍යාධිකාරි තනතුරු 3කි. ඉන් තනතුරු 2ක් ජාතික කාමරීක අධ්‍යාපන ආයතනයේ සේවයේ නියුතුව සිටි නිලධාරීන්, 2009.10.12 දින විශ්වවිද්‍යාලයට අන්තග්‍රර්හනය කිරීමේදී, සුදුසුකම් සපුරන ලද නිලධාරීන් දෙදෙනෙකු වෙත ලබා දී ඇත. විශ්වවිද්‍යාලයේ කායර්යන් වැඩි වීමත් සමග පුරප්පාඩුව පැවති සහකාර මූල්‍යාධිකාරී තනතුර සඳහා නිලධාරියකු පත්කර ගැනීමේ අවශ්‍යතාවය මත, අවශ්‍ය මූලික සුදුසුකම් සපුරන ලද අභ්‍යන්තර නිලධාරීන්ට අවස්ථාව ලබා දීම සඳහා දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවන ලදී. මෙහිදී සහකාර මූල්‍යාධිකාරී තනතුර සඳහා අයදුම්කරුවන් දෙදෙනෙකු අයදුම්කර තිබුණි. ඔවුන් සඳහා බඳවාගැනීම් පරිපාටියේ සඳහන් පරිදි ලිඛිත විභාගයක් පැවැත්වූ අතර අවශ්‍ය අවම ලකුණු වලට වඩා ලකුණු ලබා ගත් නිලධාරියා සම්මුඛ පරික්ෂණයට කැඳවන ලදී. එහිදී ලබා ගත් ප්‍රවීනතාව මත ඔහු එම තනතුරට බඳවා ගන්නා ලදී. ඉදිරියේදී සිදු කරනු ලබන සියළුම බඳවාගැනීම්, අනුමත බඳවා ගැනීම් පරිපාටියට අනුව සිදු කරන බව දන්වමි.
(උ)	අධ්‍යක්ෂ පත්කිරීම (ඇතුලත්කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතිකකිරීම)	
(i)	2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතෙහි 16 (1) වගන්තියට අනුව විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ (ඇතුලත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීම) තනතුරට පත්කිරීමේ දී තේරීම් කමිටුවක නිදෙර්ශය මත පූණර් කාලීන නිලධරයෙක් වශයෙන් පාලක මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතුය. එහෙත් එයට පටහැනිව 2014 අගෝස්තු 28 දිනැති අංක UNIVOTEC/AC/SAL/112 දරන ලිපිය මගින් 2014 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෂර් 03 ක කාලපරිච්ඡේදයක් සඳහා තනතුර දරන්නාට පුද්ගලික වනසේ ජ්‍යෙෂ්ඨ කථිකාචායර් II තනතුරක කථිකාචායර් වරයෙකුට දැනට දරන තනතුරට අතිරේක වශයෙන් විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ තනතුරෙහි පත්වීම් ලබාදී තිබුණි.	මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරන ලද අභ්‍යන්තර නිලධාරියකු පත් කිරීම සඳහා 2014 අප්‍රේල් මාසයේදී පල කරන ලද අභ්‍යන්තර දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවන ලදි. ඒ සඳහා අයදුම්පත් යොමු කරන ලද්දේ ජ්‍යෙෂ්ඨ කථිකාචායර් (II) එස්.ඒ. ලියනගේ මහතා පමණි. 2014.07.05 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී අදාල පරීක්ෂණ මණ්ඩලය මගින් ලකුණු 72 ලබාදී එම තනතුරට නිදෙර්ශ කොට තිබුණි. එම නිදෙර්ශය එම නිදෙර්ශය සඳහා 52 වන පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබු අතර 2014.08.27 දිනැති ලිපියෙන් අමාත්‍යංශ අනුමැතියද ලබා ගන්නා ලදි. ඒ අනුව 2014 සැප්තැම්බර්

		01 දින සිට අදාල වන පරිදි ඔහුට එම පත්වීම වසර 3 ක කාලපරිච්ඡේදයක් සඳහා ලබා දෙන ලදී.
(ii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයෙහි 13.1 (අ) වගන්තියට අනුව නිලධාරියෙකුට අතිරේක තනතුරක පූණර් රාජකාරී ඉටුකිරීමට හෝ එක් තනතුරකට වැඩි තනතුරු ගණනක රාජකාරී ඉටුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද ඊට පටහැනිව විශ්වවිද්‍යාලය පූණර් කාලීනව ක්‍රියා කල යුතු කථිකාචාර්ය හා අධ්‍යක්ෂ තනතුරු දෙක එකම නිලධාරියෙකුට පවරා තිබුණි. ඒ අනුව කථිකාචාර්ය තනතුරේ වැටුප් හා දීමනා වලට අමතරව අධ්‍යක්ෂ තනතුරෙහි පත්වීම් ලද 2014 සැප්තැම්බර් සිට එම තනතුරට අදාල වරප්‍රසාදයක් වන වාහන දීමනා සහ ඉන්ධන දීමනා ගෙවා තිබූ අතර විගණිත දිනය වන 2017 අප්‍රේල් දක්වා ගෙවූ මුදල රු. 942,180 ක් විය.	අදාල පත් කිරීමට අදාල සියලු විස්තර සහිතව 2014.08.19 දින අමාත්‍යාංශයට යොමු කොට ඇති අතර 2014.08.27 දිනැති ලිපියෙන් අදාල පත්වීම සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා දී ඇත. විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් සාමාජිකයින්, අධ්‍යයන අංශ ප්‍රධානී, පීඨාධිපති, අධ්‍යක්ෂ, නේවාසිකාගාර පාලක, වැනි නිලයන්ට, වසර තුනක කාල පරිච්ඡේදයකට පත් කිරීම සම්ප්‍රදාය වේ. මෙම තනතුරු හොබවනු ලබන්නේ අදාල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකත්වය දරමින් සිටියදීමය. මෙම තනතුර 2008 අංක 31 දරණ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතින් ස්ථාපිත තනතුරක් වන බැවින් අධ්‍යක්ෂක තනතුරට හිමි වාහන හා ඉන්ධන දීමනාව එම තනතුරටද හිමි වේ. ඒ අනුව අදාල දීමනාවන් ඔහු වෙත ගෙවා ඇත.
(ඌ)	**<u>රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය සඳහා වැඩබලන අධ්‍යක්ෂකවරයෙකු පත් කිරීම</u>**	
(i)	ආයතන සංග්‍රහයෙහි II පරිච්ඡේදයෙහි 13.1.2 හා 13.4 වගන්තීන්ට අනුව වැඩ බැලීමේ පත්වීමක් සඳහා පත් කරනු ලබන නිලධාරියාට අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව පත්කිරීම සඳහා සෑම අතින්ම සුදුසුකම් තිබිය යුතුය. කෙසේ වුවද අධ්‍යක්ෂ තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණු විශ්වවිද්‍යාලයේ දරන්නාට පුද්ගලික වන සේ කථිකාචාර්ය II තනතුරෙහි පිහිටුවා තිබූ කථිකාචාර්යවරයෙකු 2016 ජූලි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යායතනයේ වැඩ බලන අධ්‍යක්ෂ තනතුරට පත්කර තිබුණු අතර වැඩ බැලීමේ වැටුප් සහ ඉන්ධන දීමනා වශයෙන් විද්‍යායතනය විසින් ගෙවා තිබූ මුදල රු. 179,100 ක් විය.	මෙම නිලධාරී මහත්මා දැනටමත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු වශයෙන් සේවය කරන බැවින්, අවශ්‍යතාවය අනුව, එතුමා හට 2016.07.15 දින තාවකාලික පදනම මත මෙම තනතුර පිරිනමන ලදි. 2017.01.31 දින දක්වා පමණක් එතුමා එම තනතුර දරන ලදි.
(ii)	2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.3.1 (VI) ඡේදයට අනුව වැඩ බැලීමේ පත්වීමක් නිශ්චිත නොවූ කාලපරිච්ඡේදයක් සඳහා පත් නොකල යුතු බව දක්වා තිබියදී 2016 ජූලි 14 දිනැති අංක	රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2016 මැද භාගය වන විට ශිෂ්‍ය, සේවක සහ පාලනාධිකාරය අතර ඇතිව තිබූ දැඩි අසහනකාරී හා ගැටළුකාරී තත්ත්වයක් සමනය කිරීම උදෙසා ඉතා ඉක්මණින්

	UVT/Admin/SAL/111 දරන පත්වීමේ ලිපියට අනුව ඉදිරි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා පත්වීම් ලබා දී තිබුණි.	කළයුතු අත්‍යවශ්‍ය කායර්යක් සේ සලකා විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ අනුමැතිය යටතේ මෙම පත්කිරීම කරන ලදී. මාස තුනක කාලයකින් අදාළ සියළු ගැටළුකාරී තත්ත්වයන් සමනය කිරීමෙන් පසු අදාළ නිළධාරියා විසින්ම උක්ත වැඩ බලන නිලයෙන් ඉල්ලා අස්වීම සඳහා විශ්වවිද්‍යාලය වෙත දන්වා ඇති වුවත් සුදුසු අයෙකු පත්කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි වීම හේතුවෙන් මෙසේ මාස 6 සහ දින 15ක කාලයක් සේවයේ යොදවන ලදි. පෙන්වා දී ඇති පරිපාලනමය විධිවිධානයන්ට අනුව මින් ඉදිරියට කටයුතු කිරීමට අදාළ අංශ දැනුවත් කරන අතර පෞද්ගලිකව ද ඒ සඳහා කටයුතු කරනු ලැබේ.
5	**ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**	
5.1	**අභ්‍යන්තර විගණනය**	
	විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත ප්‍රමාණවත් කායර් මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබූ අතර අභ්‍යන්තර විගණක හා ලිපිකරු ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනකු පමණක් අනුයුක්ත කර තිබුණි.	
(අ)	2011 දෙසැම්බර් 23 දිනැති අංක DMA/ADM/2011/1-26 අංක දරන කළමනාකරණ විගණන දෙපාතර්මේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට හා මුදල් රෙගුලාසි 133 (2) (අ) (1) කෙරෙහි අවධානය යොමු කර විශ්වවිද්‍යාලයේ හා විද්‍යායතනවල ඉලක්ක සාක්ෂාත් කර ගැනීම, කායර් සාධනය, ගිණුම්කරණ, මූල්‍ය හා මෙහෙයුම් අංශයන්හි අභ්‍යන්තර පාලන ඇගයීම් වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සැලසුම් කර නොතිබුණි. තවද සමාලෝචිත වෂර්ය සඳහා පිළියෙල කරන ලද විගණන සැලැස්මට අනුව ආවරණය කිරීමට අපේක්ෂිතව තිබූ ක්ෂේත්‍ර 14ක් අතුරින් විගණිත ක්ෂේත්‍ර 2කට අදාලව වෂර්ය තුළ විගණන වාතර්ා 11ක් නිකුත් කර තිබුණ ද ඉන් වාතර්ා 05ක් පුද්ගල වැටුප් තිරණය කිරීමට අදාලව නිකුත් කර තිබුණි.	අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර විගණන හා කළමණාකරන කමිටු සහ පාලක මණ්ඩල අනුමැතිය සහිතව වෂර්ය තුළ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මත වීම සිදු වේ. ප්‍රාග්ධන ගෙවීම් ක්‍රියාවලිය ගෙවීම් කිරීමට ප්‍රථම විගණනයට ලක් කිරීම, වැටුප් සම්බණ්ධව මුහුණ දීමට සිදු වන ගැටළු නිරාකරණය කිරීම හා ගෙවීම් කිරීමට ප්‍රථම විගණනය කිරීම, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිපි ලේඛණ වාතර්ා පිළියෙල කිරීම, විගණකාධිපති දෙපාතර්මේන්තුවෙන් විටින් විට ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම වැනි කටයුතු හා විගණන සැලැස්මෙහි අනෙකුත් කටයුතු අභ්‍යන්තර විගණන අංශයෙන් ඉටු වේ. ගෙවීම් කිරීමට ප්‍රථම විගණනයට ලක් කල විට නිරීක්ෂණය වන අඩුපාඩු නිවැරදි කිරීම සිදු වන නිසා ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් සංඛ්‍යාව අඩුවීම සිදු වේ.

(ආ)	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය යටතේ ආරම්භ කල විශ්වවිද්‍යාල විද්‍යායතන 06 හි අභ්‍යන්තර විගණන කායර්යන්හි වගකීම මෙම අංශය වෙත පැවරී තිබුණද විද්‍යායතන සම්බන්ධයෙන් අඛණ්ඩ විගණනයක් සිදු කර නොතිබුණි. සමාලෝචිත වෂර්ය තුළ අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය පමණක් විගණනය කර වාතර්ාවක් නිකුත් කර තිබුණි.	මෙම විශ්වවිද්‍යාලයේද සිටිනුයේ සහකාර අභ්‍යන්තරවිගණක වරයෙකු පමණකි. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරක් සඳහා අනුමැතිය 2014 වෂර්යේ සිට කළමණාකරන සේවා දෙපාතර්මේන්තුවෙන් ඉල්ලුම් කලද, මේ දක්වා ලැබී නොමැත. අභ්‍යන්තර විගණන අංශයෙහි සේවය කරන සීමිත මානව සම්පත් සංඛ්‍යාව උපයෝගී කර ගනිමින් 2016 වෂර්යේ එක් විශ්වවිද්‍යාල විද්‍යායතනයක් පමණක් පරීක්ෂාවට ලක් කරන ලදී. වතර්මානයේ කොන්ත්‍රාත් පදනම මත පත් කර ඇති අභ්‍යන්තර විගණක වරයෙකු මගින් විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි අභ්‍යන්තර විගණක කටයුතු සිදු කෙරේ.
5.2	<u>වාෂර්ික වාතර්ා සභාගත කිරීම</u>	
	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.3 ඡේදය ප්‍රකාරව විගණන වාතර්ාව සමග වාෂර්ික අවසාන ගිණුම් ඇතුලත් වාෂර්ික වාතර්ාව භාෂාත්‍රයෙන් සකස්කර මූල්‍ය වෂර්ය අවසන් වී දින 150 ක් තුළ පාලර්මේන්තුවේ සභාගත කල යුතු වුවත් විශ්වවිද්‍යාලයේ 2015 ගිණුම් වෂර්යන් සඳහා වාෂර්ික වාතර්ා පාලර්මේන්තුවේ සභාගත කර නොතිබුණි.	2015 වාෂර්ික වාතර්ාව - 2018.02.14 දින නිපුණතා සංවධර්න හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ අනුමැතියට යොමු කොට ඇති අතර එය ලද වහාම පාලර්මේන්තුවට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.